
# බුද්ධ ධර්මය

# 7 ශ්‍රේණිය



# 06.බුදුසසුනේ අග්‍රදායකයා හා අග්‍ර දායිකාව

***අනේ පිඬු සිටුතුමා (අග්‍ර දායකයා)***




- පියා- සුමන සිටුතුමා
- මුල්නම- සුදත්ත
- ගම- සැවැත් නුවර
- භාර්යාව- රජගහනුවර සිටුවරයාගේ දියණිය
- රැකියාව- වෙළෙඳ ව්‍යාපාර කටයුතු
- පටබැඳි නාමයන්- අනාථ පිණ්ඩික/අනේපිඬු
- දරු පිරිස- කාල සිටුපුත්/ මහා සුභද්‍රා /චූල සුභද්‍රා හා සුමනා

- මෙතුමා අනාථයන් උදෙසා ආහාර පාන පරිත්‍යාග කළ බැවින් අනාථපිණ්ඩික නම් වී ඇත.

- මෙතුමා බුදුරදුන් පළමුව හමු වි ඇත්තේ රජගහනුවර සීත වනයේදීය.
- එහි දී බණ ඇසූ ඔහු සෝවාන් ඵලයට පත් වී ඇත.

## ආගමික හා ශාසනික සේවය

- කහවණු දහඅටකෝටියක් වැය කොට ජේත කුමරුගෙන් ඉඩමක් මිලදී ගෙන ජේතවනාරාමය නිර්මාණය කොට පූජා කිරීම.
- මෙම විහාර කර්මාන්තය සඳහා කහවණු දහඅටකෝටියක් වැය කිරීම
- ජේතවනාරාමය සසුනට පූජා කිරීමේ පිංකම සඳහාද කහවණු දහඅටකෝටියක් වැය කිරීම.
- ඉඩම මිලදී ගැනීම ආරාමය කරවීම පූජා කරවීම තෙක් කහවණු පනස්හතර කෝටියක් වැය කිරීම.

- වසර 19ක් බුදුරදුන් ප්‍රමුඛ මහා සඟරුවනට අවශ්‍ය දන් පැන් පූජා කිරීම.
- සිටු නිවසේ සියල්ලෝම  සැදැහැති බෞද්ධයන් බවට පත්කිරීම.

  උදා-: තම දරු පිරිස

  මුණුබුරු මිණිබිරියන්


  පුණ්ණා නම් සේවිකාව
-  ආනන්ද හිමිගේ මග පෙන්වීම යටතේ දෙව්රම් වෙහෙරෙහි(ජේතවනාරාමයේ) ආනන්ද බෝධි අංකුරය රෝපණය කිරීම.
- දිවියේ අවසාන භාගයේදී සැරයුත් තෙරුන්ගෙන් බණ අසා මියගොස් මෙතුමා තුසිත දිව්ලොව  උපත ලබා ඇත.

# අනේපිඬුසිටුතුමාගේ දිවියෙන් අපට ගත හැකි ආදර්ශ

- තෙරුවන් පිලිබඳව අචල ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම.
- යහපත් අරමුණු ඉටුකර ගැනීමට කැපවීම.
- දරුවන් හා සෙසු පිරිස් සුමඟට ගැනීම.
- අසරණයින්ට පිහිට වීම.
- දැහැමි ජීවන රටාවක් අනුගමනය කිරිම.
- ආශ්‍රිතයන් ආගම දහමට නැඹුරු කරවීම.
- සුළු පරිත්‍යාග වුව ද අගය කිරීම හා කළගුණ සැලකීම.

# විශාඛා මහ උපාසිකාව(අග්‍ර දායිකාව)

- මව- සුමනා දේවිය
- පියා- ධනංජය සිටු තුමා
- සීයා- මෙණ්ඩක  සිටුතුමා
- ගම- භද්දිය නුවර
- ස්වාමියා- පූර්ණවර්ධන සිටුතුමා
- මාමා- මිගාර සිටුතුමා
- පටබැඳි නාමය- මිගාර මාතා




- මෙතුමිය වයස අවුරුදු 7 දී සෝවාන් විය.
- විශාඛා දියණිය පංච කල්‍යාණයෙන් යුක්ත විය.
  - කේශ කල්‍යාණය
  - දන්ත කල්‍යාණය
  - ඡවි කල්‍යාණය
  - මාංශ කල්‍යාණය
  - වයඃ කල්‍යාණය

- මෙලොව සිටින සිව්දෙනෙකු මහ මඟ දිව යාම අශෝභන බවත් එවිට ඔවුන් බොහෝදෙනාගේ දෝෂාරෝපණයට ලක්වන බවත් විශාඛා දියණිය පවසා ඇති
- එම සිව්දෙනා -
  - සියළු ආභරණවලින් සැරසුනු මහ රජතුමා
  - සර්වාභරණයෙන් විභූෂිත මංගල හස්ති රාජයා
  - සංවර ශීලයෙන් යුතු ශ්‍රමණයන් වහන්සේ
  - සළුපිළි අබරණින් සැරසුණු කුල කුමරිය

- මංගල උත්සවයට පෙර දින රාත්‍රියේ විශාඛාවට ධනංජය සිටුතුමා විසින් ලබාදුන් උපදේශ 10කි.
  - ඇතුළත ගිනි පිටතට නොදිය යුතුය.
  - පිටත ගිනි ඇතුළට නොගත යුතුය.
  - දෙන්නාට දිය යුතුය.
  - නොදෙන්නාට දිය යුතුය.
  - දෙන්නාට ද නොදෙන්නාට ද දිය යුතුය.
  - සුවසේ හිඳගත යුතුය.
  - සුවසේ අනුභව කළ යුතුය.
  - සුවසේ නිදාගත යුතුය.
  - ගිනි පිරිමැසිය යුතුය.
  - ඇතුළත දෙවියන් පිදිය යුතුය.
- විවාහ මංගල දිනයේදී ධනංජය සිටුතුමා විසින් විශාඛාවට නව කෝටියක් වටිනා **මේල පළඳනාවක්** ලබා දී ඇත.

# ආගමික හා ශාසනික සේවය

- ජෛන බැතිමතුන් වූ මිගාර සිටු පවුල බෞද්ධයන් බවට පත් කිරීම.
- පෙහෙවස් සමාදන් වී එක් එක් වයස් වල කාන්තාවන් සමඟ ධර්ම සාකච්ඡා පැවැත්වීම.
- මේල පළඳනාව මිල කොට සැවැත්නුවර පූර්වාරාමය ඉදිකොට පූජා කිරීම.
- උදේ වරුවේ විහාරයට ගොස් දන් පිලිගැන්වීම හා සවස රෝගී භික්ෂූන්ට කැඳ හා බෙහෙත් පූජා කිරීම.
- **අවුරුදු 120 ක් දිවි ගෙවූ ඇය මරණින් මතු තුසිත දෙව්ලොව උපන්නාය.**

# විශාඛා උපාසිකාවගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ

- ගැහැණු ළමයෙකුට උචිත ඉරියව් පවත්වාගෙන යාම.
- දියණියක ලෙස දෙමාපිය උපදෙස් නිසි පරිදි පිළිපැදීම.
- බිරිඳක, ලේලියක , මවක ලෙස සිය යුතුකම් ඉටු කිරීම.
- ධන බලයෙන් හා රූමත්කමින් උඩඟු නොවීම.
- ආගමට දහමට ළැදිව ක්‍රියා කිරීම.
- බුද්ධිමත් තීරණ ගැනීම.
- අලස නොවීම.
- වැරදි මග ගියවුන් සුමඟට ගැනීම.
- විවාහය නිසා තම ආගම වෙනස් නොකිරීම.
- දැනුම බෙදා හදා ගැනීමට යොමු වීම.